GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

09-08-2012

# මාධ්‍ය නිවේදනයයි

රටක ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රධාන පාර්ශවයන් දෙකක් පුරෝගාමී ලෙස කටයුතු කරයි. මෙම පාර්ශව දෙක නම්,

1. වෘත්තියවේදීන්
2. ව්‍යාපාරික ප්‍රජාව

මේ නිසා රටක ආර්ථිකය සම්බන්ධයෙන් තීරණාත්මක තීන්දු ගැනීමේදී මෙම පුරෝගාමී පාර්ශව වල අදහස් හා යෝජනා සැලකිල්ලට ගැනීම දියුණුවන ආර්ථිකයක් සහිත රටවල පිළිගත් ප්‍රතිපත්තියයි. එසේ නොකිරීමෙන් රටවල ආර්ථික සංවර්ධනය වෙනුවට ආර්ථික හා සමාජීය පරිහානිය පමණක්ම සිදුවේ.

## CEPA /SATIS යනු,

දකුණු ආසියානු රටවල් තුල (මුලිකවම ඉන්දියාව) භාණ්ඩ හා සේවා නිදහස් ලෙස කරගෙන යාම සඳහා ඇති කර ගැනීමට යෝජිත ගිවිසුම් වේ. මෙහිදී CEPA ගිවිසුම මගින් භාණ්ඩ හා සේවා, නිදහස් මිනිස් සංචරණයද (Free Movement) SATIS ගිවිසුම මගින් බොහෝ සේවා සඳහා ද නිදහස් ගනුදෙනු අවස්ථා උදාකරලිම යෝජනා කරයි.

## මෙම ගිවිසුම මගින් ශ්‍රී ලංකාව තුල සිදුවන බලපෑම

- ශ්‍රී ලංකාවේ විරැකියාව ඉන්දියවේ විරැකියා අගයට වඩා ඉතා පහල අගයක් (1:120) ගන්නා අතර ශ්‍රී ලාංකික ජනගහනය ඉන්දිය (1:60) ජනගහනයට වඩා ඉතා පහල අගයක් ගනී.

- ඉන්දියවේ අඩු සුදුසුකම් ශ්‍රමිකයින් සහ වෘත්තියවේදීන් ලාභදායි මිලකට සේවා සැපියීමට ඉදිරිපත් විය හැක.

ඉහත කරුණු දෙක නිසා ඉතා විශාල ලෙස ඉන්දිය ශ්‍රමිකයින් සහ වෘත්තියවේදීන් ලංකාවට පැමිණීම නොවැලැක්විය හැකි වනු ඇත.

ලාභදායි තත්ත්වයෙන් අඩු සියලු ආකාරයේ සේවාවන් ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වනු ඇත එම නිසා ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් සේවාවන් සැපයීම සුදුසුකම් වලින් පරිපූර්ණ ලාංකික ශ්‍රමිකයින් හා වෘත්තිවේදීන් හට අවස්ථාවක් නොලැබී යාමේ අවධානමක් පවතී.

මේ කරුණු අනුව දේශීය වෘත්තිය වේදීන්ගේ සහ ශ්‍රමිකයන්ගේ ආදායම අඩුවී ඉන්දීය ශ්‍රමිකයන්ගේ සහ වෘත්තිය වේදීන්ගේ ආදායම් ඉහල යාමද සිදුවේ.

අවසානයේදී ලංකාවේ මුදල් ඉතා විශාල ලෙස ඉන්දියාවට ඇදී යාමත් කළකිරීමට පත්වන දේශීය ශ්‍රමිකයන් සහ වෘත්තිය වේදීන් රට අතහැර යාමත් සිදු වනු ඇත.

**මෙම ගිවිසුම් නිසා සෞඛ්‍ය සේවයට සිදුවන බලපෑම්**

ලංකාව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දර්ශක අනුව දියුණු රටවල දර්ශක මට්ටමට ලගාවී පවතී.

නමුත් මෙවැනි ගිවිසුම් මඟින් ඉන්දිය සුදුසුකම් නොලත් වෘත්තිය වේදීන් දිවයිනට පැමිණිම තුල මෙම සෞඛ්‍ය දර්ශක කඩා වැටීමේ දැඩි අවධානමක් පවතී. ඊට අමතරව මෙම සුදුසුකම් නොලත් වෘත්තිය වේදීන්ගේ ක්‍රියාකාරකම් තුලින් ඇතිවන සංකූලතා නිවැරදි කිරීම රජයට බරපැන දැරීමට සිදුවේ.

මෙයට හොඳම උදාහරණයක් ලෙස දැනට පෞද්ගලික රෝහල් වල සේවය කරන විදේශිය විශේෂඥ වෛද්‍යවරුන් යැයි කියා ගන්නා 184 දෙනෙකු අතරින් බොහෝ දෙනෙකු මූලික සුදුසුක්මවත් සපුරා නැති අතර ඔවුන් කරන ලද සැත්කම් තුලින් සංකූලතා ඇති වු රෝගීන් ජාතික රෝහලට හා රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇතුලත් කිරීම පෙන්වා දිය හැක.

මෙම සියලුම කරුණු සාරාංශගත කොට ගත් විට මෙම ගිවිසුම් තුලින් රටට හෝ රටේ ජනතාවට කිසිඳු ආකාරයේ සහනයකත් සිදු නොවන අතර හුදෙක්ම තවත් රටක රැකියා සපයන මධ්‍යස්ථානයක් පමණක් බවට පත් වී රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය වෙනුවට සියලුම අංශයෙන් කඩා වැටීමක් පමණක් සිදුවනු ඇත.

අප සංගමය මෙහිදී යෝජනා කරනුයේ මෙම අදාල ගිවිසුම් දෙක පිළිබඳ විවෘත සංවාදයක් ඇති කලයුතු අතර එයට වෘත්තියවේදීන්ගේ දායකත්වය ලබා ගත යුතු බවත් එසේ නොකර ඇති කර ගන්නා ගිවිසුම් තුලින් විරෝධතා සහ නොවැලැක් විය හැකි සේවා කඩා වැටීම් වලට පමණක් මගපැදීමක් වනු ඇති බවය.

ස්තූතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩි විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444